සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස.(උ.පෙළ)විභාගය - 2021 (2022)

# 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

ලකුණු දීමේ පටිපාටිය







මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයය කොටස් දෙකකින් සමන්විත වේ. ඉන් I පත්‍රය බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත වෙයි. II වන පත්‍රය කොටස් දෙකකින් සමන්විත වන අතර පළමු කොටසට ප්‍රශ්න 3ක්ද, දෙවන කොටසට ප්‍රශ්න 5ක්ද ඇතුලත් වෙයි.

I පත්‍රයේ බහුවරණ ප්‍රශ්න 50ටම පිළිතුරු සැපයීම අපේක්ෂා කරයි. එම ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී මුළු විෂය නිර්දේශයම ඇතුළත් වන සේ ප්‍රශ්න සකසා ඇති අතර එමඟින් ශිෂ්‍යයා තුළ විෂයය පිළිබඳ ඇති පරිපූර්ණ දැනුම පරීක්ෂා කරයි. II වන පත්‍රයේ පළමු කොටසේ ප්‍රශ්න තුනෙන්, දෙකකට පිළිතුරු ලිවිය යුතු අතර, II වන කොටසේ ප්‍රශ්න පහෙන් ප්‍රශ්න තුනකට පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ. මෙම දෙවන පත්‍රයේ පළමු කොටසේ ප්‍රශ්නයකට කොටස් හතරක් ඇතුලත් වෙයි. ඉන් පළමු කොටස් දෙකකට අසා ඇති කරුණු පමණක් ලිවිය යුතු අතර 3,4 කොටස් දෙකට කෙටි විස්තරයක් ලිවීම අපේක්ෂා කෙරෙයි. ලැබෙන ලකුණු ප්‍රමාණයද ක්‍රමානුකූලව වැඩි වර්ධනය වන ආකාරයට ප්‍රශ්න සකසා ඇත. II වන පත්‍රයේ II කොටසේ ප්‍රශ්නයකට කොටස් දෙකක් ඇතුළත් වෙයි. කොටස්වලට ලැබෙන ලකුණු ප්‍රමාණයද සමසේ බෙදී යයි. ප්‍රශ්නයේ පළමු කොටසින් අසා ඇති ප්‍රශ්නයේ අන්තර්ගතය පිළිබඳව විෂයය දැනුම පරීක්ෂා කෙරෙන අතර දෙවන කොටසෙන් අසා ඇති ප්‍රශ්නයට අනුව ශිෂ්‍යයාගේ ප්‍රායෝගික දැනුම විමර්ශනය කරයි.

# ලකුණු ගණනය කිරීම

## I පත්‍රය - බහුවරණ ප්‍රශ්න

එක ප්‍රශ්නයකට ලකුණු - 01

ප්‍රශ්න 50ට ලකුණු - 50 X 1 = 50

## II පත්‍රය

### I කොටස

ලකුණු බෙදී යන ආකාරය

| | |
|---|---|
| I කොටස | 2 |
| II කොටස | 4 |
| III කොටස | 6 |
| IV කොටස | 8 |
| | 20 |

ප්‍රශ්න 2ට ලකුණු 2 X 20 = 40

### II කොටස

ලකුණු බෙදී යන ආකාරය

| | |
|---|---|
| I කොටස | 10 |
| II කොටස | 10 |
| | 20 |

ප්‍රශ්න 3ට ලකුණු 3 X 20 = 60

## II පත්‍රය

මුළු ලකුණු 5 X 20 = 100

### අවසාන ලකුණු ගණනය කිරීම්

I පත්‍රය 50 X 1 = 50

**අවසාන ලකුණු** $$50 + \left(\frac{100}{2}\right)$$

$$= \underline{100}$$

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ $\triangle \frac{4}{5}$

(ii) ............................................................ √ $\triangle \frac{3}{5}$

(iii) ............................................................ √ $\triangle \frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

## බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට

   අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

## ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

## ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. ශිෂ්ටාචාරයේ තොටිල්ල වශයෙන් හඳුන්වනු ලබන්නේ,
   (1) ඊජිප්තුවයි. (2) ඉන්දු නිම්නයයි.
   (3) රෝමයයි. (4) ග්‍රීසියයි.
   (5) මෙසපොතේමියාවයි.

2. පහත ප්‍රකාශ සලකන්න.
   A - දර්ශනය සහ විද්‍යාත්මක ගවේෂණයට මුල පිරීම
   B - මුදල් පරිහරණය හඳුන්වා දීම
   C - ජ්‍යොතිෂය, උද්භිද විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව වැඩිදියුණු කිරීම
   D - කෘෂිකර්මය සහ මුහුදු මාර්ගික වෙළඳාම වැඩිදියුණු කිරීම
   E - ලේඛන කටයුතු සඳහා පැපිරස් භාවිත කිරීම
   මේවායින් ග්‍රීක සංස්කෘතියෙන් ලොවට දායාද කරන ලද්දේ මොනවාද?
   (1) A, B සහ C (2) A, C සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

3. පුරාණ නිපුර් නගරය පිහිටා තිබුණේ,
   (1) බැබිලෝනියාවේ ය. (2) ඊජිප්තුවේ ය.
   (3) ග්‍රීසියේ ය. (4) ජෝර්දානයේ ය.
   (5) ඊදොම්හි ය.

4. රෝම ශිෂ්ටාචාරයට සම්බන්ධ **නොවන** ප්‍රකාශය කුමක් ද?
   (1) අධිරාජ්‍යයේ පරිපාලනය සහ දේශපාලන සහජීවනයක් පැවතීම
   (2) දෙවියන්, දේවතාවියන් සහ වීරයන් වෙනුවෙන් උත්සව පැවැත්වීම
   (3) අධිරාජ්‍යයේ ආගමික සහ දේශපාලන සහජීවනයක් පැවතීම
   (4) ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටයන් වීම
   (5) ලෝකයේ ප්‍රථම දින දර්ශනය නිර්මාණය කිරීම

5. පහත ප්‍රකාශ සලකන්න.
   A - හනුක්කා අස්වැන්න මංගල්‍යයකි.
   B - පෙන්තකොස්තය අස්වැන්න මංගල්‍යයකි.
   C - පෙන්තකොස්ත මංගල්‍යය 'යෝම් කිප්පූර්' යන නමින් හැඳින්වේ.
   D - කූඩාරම් මංගල්‍යය 'සුක්කොත්' යනුවෙන් හැඳින්වේ.
   E - පාස්කු මංගල්‍යය මාර්තු-අප්‍රේල් මාසවලදී සිදු කරයි.
   මේවායින් ඊශ්‍රායල්වරුන්ගේ මංගල්‍ය පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
   (1) A, B සහ C (2) A, B සහ E (3) B, C සහ D (4) B, C සහ E (5) B, D සහ E

**6.** ක්‍රි.ව. 6 දී රෝම අධිරාජයා විසින් බලයෙන් පහකළ ජුදා පාලකයා වන්නේ,
(1) මහ හෙරෝද් ය. (2) පිලිප් ය.
(3) පළමුවන අග්‍රිපා ය. (4) ආර්කෙලාවුස් ය.
(5) හෙරෝද් අන්තිපස් ය.

**7.** ගෙරිසිම් කන්ද පිහිටා ඇත්තේ,
(1) සමාරියාවෙහි ය. (2) ජුදයාවෙහි ය.
(3) ඉහළ ගලීලයේ ය. (4) පහළ ගලීලයේ ය.
(5) ජෝර්දානයේ ය.

**8.** එලිජා දිවැසිවරයා ජීවත් වූයේ කුමන රජතුමාගේ කාලයේ දී ද?
(1) සලමොන් (2) ජෙරබොවාම්
(3) ආහබ් (4) ජොසියා
(5) සෙඩකියා

**9.** එස්රා අයත් වන්නේ කුමන පෙළපතකට ද?
(1) ජුදා (2) බෙන්ජමින්
(3) මනස්සේ (4) එප්‍රායිම්
(5) ආරොන්

**10.** පහත ප්‍රකාශ සලකන්න.
A - බෙතල් පිහිටා ඇත්තේ සමාරියාවෙහි ය.
B - රෙහෙබොවාම් රජ කළේ සමාරියාවෙහි ය.
C - ජෙරබොවාම් රජ කළේ සමාරියාවෙහි ය.
D - සමාරියාවෙහි අවසාන රජ වන්නේ සෙඩකියා ය.
E - ජාකොබ්ගේ ළිඳ පිහිටා ඇත්තේ සමාරියාවෙහි ය.

මේවායින් සමාරියාවට සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**11.** "එහෙත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යය ද ධර්මිෂ්ඨකම ද සොයන්න. එවිට මේ සියල්ල ඔබට දෙනු ලැබේ." (මතෙව් 6:33). ක්‍රිස්තුන්වහන්සේ මේ වචන වදාළේ,
(1) ගලීලයේ මුහුද අසබඩ දී ය.
(2) ශ්‍රාවකයන් කැඳවනු ලැබූ අවස්ථාවේ දී ය.
(3) අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේ දී ය.
(4) කන්ද උඩ දේශනාවේ දී ය.
(5) කුරුස ගසේ දී ය.

**12.** මුල් කිතුනුවන්ගේ ගුණාංග තුනක් ඇතුළත් වරණය කුමක් ද?
(1) සාමූහික ජීවිතය, අන්‍ය භාෂා කථා කිරීම සහ යාච්ඤාව
(2) බෙදාගැනීම, සාමූහික ජීවිතය සහ දුක්ප්‍රාප්තිය මෙනෙහි කිරීම
(3) යාච්ඤාව, එක්සත් බව සහ බෙදාගැනීම
(4) එක්සත් බව, දුක්ප්‍රාප්තිය මෙනෙහි කිරීම සහ යාච්ඤාව
(5) එක්සත් බව, අන්‍ය භාෂා කථා කිරීම සහ යාච්ඤාව

**13.** කිතුනුවන්ට ප්‍රථමයෙන් පීඩා කරනු ලැබුවේ,
(1) පාවුලුතුමා ය. (2) ඩොමීෂියන් ය.
(3) නීරෝ ය. (4) ට්‍රාජන් ය.
(5) වැලේරියන් ය.

**14.** රෝම පීඩන සමයෙහි විසූ 'දෙවිඳුන් දරන්නා' යන විරුදාවලිය ලැබූ ප්‍රාණ පරිත්‍යාගිවරයා කවුද?
(1) ශුද්ධ වූ පේදුරුතුමා
(2) ශුද්ධ වූ තිමෝතිතුමා
(3) ශුද්ධ වූ ජස්ටින්තුමා
(4) ශුද්ධ වූ සිසිලියා මුනිවරිය
(5) අන්තියෝකයේ ශුද්ධ වූ ඉග්නේෂියස්තුමා

**15.** ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භක යුගයේ පැවති ග්‍රීක දාර්ශනික චින්තනයන් තුනක් ඇතුළත් වරණය කුමක් ද?
(1) ස්ටොයිකවාදය, ප්ලෙටොනික්වාදය සහ නොස්ටික්වාදය
(2) ස්ටොයිකවාදය, නොස්ටික්වාදය සහ ඇරිස්ටොටේලියන්වාදය
(3) නොස්ටික්වාදය, ඩොසටික්වාදය සහ මැනිකියන්වාදය
(4) ප්ලෙටොනික්වාදය, ස්ටොයිකවාදය සහ මැනිකියන්වාදය
(5) ප්ලෙටොනික්වාදය, ඇරිස්ටොටේලියන්වාදය සහ එපිකියුරියන්වාදය

**16.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - තාර්සස්හි උපත ලැබීය.
B - උපතින් රෝම පුරවැසිභාවය උරුම වූවෙකි.
C - ජෙරුසලම කරා යද්දී සිත්හැරීම සිදුවිය.
D - ගමාලියෙල් නමැති පඬිවරයා යටතේ ඉගෙනුම ලැබීය.
E - ශුද්ධ වූ ජාකොබ්තුමන්ගේ ගෝලයෙකි.

මේවායින් ශුද්ධ වූ පාවුලුතුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**17.** ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ ක්ලෙමන්ට්තුමා විසින් රචිත ග්‍රන්ථ දෙකක් වන්නේ,
(1) ග්‍රීකයන්ට උපදෙස් සහ පේළි හයක ශුද්ධ බයිබලයයි.
(2) කිතු දහමේ හඳුන්වා දීම සහ ක්‍රිස්තු වේද ආධාරකයයි.
(3) ඇපොලොජියා සහ ග්‍රීකයන්ට උපදෙස් ය.
(4) කිතු දහමේ හඳුන්වා දීම සහ ග්‍රීකයන්ට උපදෙස් ය.
(5) කිතුනු විශ්වාසය සහ පේළි හයක ශුද්ධ බයිබලයයි.

**18.** ක්‍රිස්තුන්වහන්සේ විසින් තම දුක් විඳීම හා මරණය පිළිබඳව ශ්‍රාවකයන්ට පුරෝකතනය කළේ කුමන අවස්ථාවේදීද?
(1) ජෝර්දාන් නදියෙන් බෞතිස්මය ලැබූ විට ය.
(2) විනයධරයන් සමඟ සාකච්ඡා කළ අවස්ථාවේ දී ය.
(3) ස්නාවක ජුවාම්තුමාගේ මරණයෙන් පසුව ය.
(4) පේදුරුතුමාගේ නැන්දනිය සුව කළ අවස්ථාවේ දී ය.
(5) "මෙසියස් යැයි ඔබ සිතන්නේ කවුරුන් ද" කියා ප්‍රශ්න කළ පසුව ය.

**19.** පහත සඳහන් යුගල අතුරෙන් එකිනෙකට ගැළපෙන යුගලය කුමක් ද?
(1) සෙප්ටුවාජින්ත - ග්‍රීසියේ සාමාන්‍ය ජනතාව භාවිත කළ භාෂාව
(2) තාර්ගුම් - බයිබලයේ ඇරමෙයික් පරිවර්තනය
(3) වල්ගේට් - ඉන්දු භාෂා පවුලට අයත් ය
(4) කොයිනේ - බයිබලයේ ග්‍රීක පරිවර්තනය
(5) ග්‍රීක භාෂාව - බයිබලයේ ලතින් පරිවර්තනය

**20.** මුල් සභාවේ භාවිත සංකේත අතුරෙන් 'මත්ස්‍යයා' මගින් සංකේතවත් වන්නේ,
(1) පූප වැඩි කිරීමයි. (2) අන්තිම රාත්‍රී භෝජනයයි.
(3) ක්‍රිස්තුන්වහන්සේයි. (4) අපෝස්තුළුවරුන්ගේ කැඳවීමයි.
(5) දිව්‍ය සත්ප්‍රසාදයයි.

**21.** නිසියාන, එපීසිය සහ කැල්සඩෝන යන මන්ත්‍රණ සභාවන්ට පාදක වූ වේද භේදයන් අනුපිළිවෙලින්,
(1) ඒරියන්වාදය, මැසදෝනියවාදය සහ නෙස්ටෝරියන්වාදයයි.
(2) ඒරියන්වාදය, නෙස්ටෝරියන්වාදය සහ එව්ටීකියන්වාදයයි.
(3) මැසදෝනියවාදය, නෙස්ටෝරියන්වාදය සහ නොස්ටික්වාදයයි.
(4) මැසදෝනියවාදය, නෙස්ටෝරියන්වාදය සහ එව්ටීකියන්වාදයයි.
(5) නෙස්ටෝරියන්වාදය, නොස්ටික්වාදය සහ එව්ටීකියන්වාදයයි.

**22.** පෙරදිග හා අපරදිග තාපස ජීවිතයට ක්‍රමවත් නීති පද්ධති හඳුන්වා දුන් දෙදෙනා කවුරුන් ද?
(1) ශුද්ධ වූ බැසිල්තුමා සහ ශුද්ධ වූ බෙනඩික්තුමා ය.
(2) තිබිස් හි ශුද්ධ වූ පාවුලුතුමා සහ ශුද්ධ වූ පකෝමියස්තුමා ය.
(3) ඊජිප්තුවේ ශුද්ධ වූ අන්තෝනිතුමා සහ ශුද්ධ වූ බෙනඩික්තුමා ය.
(4) ශුද්ධ වූ පකෝමියස්තුමා සහ ශුද්ධ වූ බැසිල්තුමා ය.
(5) තිබිස් හි ශුද්ධ වූ පාවුලුතුමා සහ ශුද්ධ වූ බෙනඩික්තුමා ය.

**23.** ශුද්ධ වූ පාවුලුතුමාගේ තුන්වන ධර්ම දූත ගමනට එක් වූ ශ්‍රාවකයන් ඇතුළත් වරණය කුමක් ද?
(1) මාර්ක්, ලූක් සහ බර්ණබස් (2) බර්ණබස්, තිමති සහ ලූක්
(3) මාර්ක්, ටයිටස් සහ තිමති (4) තිමති, ටයිටස් සහ ලූක්
(5) ලූක්, තිමති සහ මාර්ක්

**24.** පහත සඳහන් කරුණු සලකන්න.
A - ඔහු රෝම ජාතිකයෙකි.
B - පාප උච්ඡාරණය (ජීවිත වාර්තාව) නැමැති ග්‍රන්ථයෙහි එතුමන්ගේ ජීවිතය ගැන සඳහන් කරයි.
C - ඔහුගේ මව ශාන්ත හෙලේනාතුමියයි.
D - ඔහු ශ්‍රේෂ්ඨ චින්තකයෙකු හා රදගුරුතුමෙක් වෙයි.
E - සාන්ත අම්බ්‍රෝස්තුමාගේ මග පෙන්වීම මත ඔහු ජීවිතය වෙනස් කරගත්තේ ය.
මේවායින් ශුද්ධ වූ අගුස්තීනුතුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවාද?
(1) A, B සහ C ය. (2) A, C සහ D ය. (3) B, C සහ D ය. (4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**25.** පැට්රික්තුමා, කැන්ටබරියේ අගුස්තීනු තාපසතුමා සහ කොලොම්බන්තුමා සේවය කළ රටවල් අනුපිළිවෙලින් සඳහන් වරණය කුමක් ද?
(1) එංගලන්තය, අයර්ලන්තය සහ ස්කොට්ලන්තය
(2) අයර්ලන්තය, ස්කොට්ලන්තය සහ ජර්මනිය
(3) එංගලන්තය, අයර්ලන්තය සහ ජර්මනිය
(4) අයර්ලන්තය, එංගලන්තය සහ ස්කොට්ලන්තය
(5) අයර්ලන්තය, ජර්මනිය සහ එංගලන්තය

**26.** බෙනදික්තාන නිකායේ ප්‍රධාන දායකත්වයක් **නොවන්නේ** කුමක් ද?
(1) පැවිදි ජීවිතය සඳහා නීති මාලාවක් හඳුන්වාදීම
(2) යුරෝපයේ ගෝත්‍රිකයන්ගේ සිත්හැරීමට දායකවීම
(3) ශුද්ධ වූ බයිබලය ගැඹුරින් හැදෑරීමට යොමු කිරීම
(4) සමාජ සේවා කටයුතුවල නියැලීම
(5) යුරෝපයේ අධ්‍යාපනයේ දියුණුවට කටයුතු කිරීම

**27.** පහත සඳහන් කරුණු සලකන්න.
A - පෙර-අපරදිග සභාවේ නායකයන් අතර ගැටුම්
B - බයිබලයේ සම්මත ග්‍රන්ථ සංඛ්‍යාව පිළිබඳ ගැටලුව
C - 'ෆිලියෝක්වේ' යන ඉගැන්වීම පිළිබඳ ගැටලුව
D - පූර්ණඵල වෙළඳාම පිළිබඳ ගැටලුව
E - විශ්වාසයේ ප්‍රතිපත්තිවල වැදගත්කම
මේවායින් පෙර-අපරදිග සභා භේදයට තුඩුදුන් කරුණු මොනවාද?
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය. (4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**28.** කුරුස යුද්ධය ඇතිවීමට හේතුව වන්නේ,
(1) මුස්ලිම්වරුන් සමග වූ අර්බුදයයි.
(2) කොන්ස්තන්තිනෝපල් නගරය යටත්කර ගැනීමයි.
(3) මුස්ලිම්වරුන් යුරෝපයට පැමිණීම වැළැක්වීමයි.
(4) මැද පෙරදිග කිතු දහම පැතිරවීමයි.
(5) ශුද්ධ වූ දේශය මුස්ලිම්වරුන්ගෙන් නිදහස් කර ගැනීමට අවශ්‍ය වීමයි.

**29.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - ගලීලයේ පිහිටා ඇත.
B - ජුදෙයාවේ පිහිටා ඇත.
C - ජුදා ජාතියේ සංකේතයයි.
D - දාවිත් රජු විසින් ගොඩනගන ලදී.
E - සලමොන් රජු විසින් ගොඩනගන ලදී.
මේවායින් ජෙරුසලෙම් දේව මාලිගය පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවාද?
(1) A, B සහ C ය. (2) A, B සහ E ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) B, D සහ E ය.

**30.** පහත ප්‍රකාශ සලකන්න.

A - සභාව ලෞකිකත්වයට බරවීම.

B - සභා නායකයන්ගේ සදාචාරයෙන් තොර හැසිරීම.

C - පුනරුදයෙන් වූ බලපෑම.

D - පූර්ණඵල විකිණීම හා අධික බදු අය කිරීම.

E - ශුද්ධ රෝම අධිරාජ්‍යයෙන් නිදහස් වීමට තිබූ උවමනාව.

මේවායින් ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට බලපෑ ප්‍රධාන හේතු මොනවාද?

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය. (4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**31.** ආධ්‍යාත්මික දියුණුව සඳහා ජාකොබුස් දේ ඔරාජිනේතුමා විසින් සම්පාදනය කළ ග්‍රන්ථය වන්නේ,

(1) ආත්මික ජීවිතය (2) ක්‍රිස්තුන්වහන්සේගේ ජීවිතය

(3) ශුද්ධවන්තයන්ගේ ජීවිතය (4) ක්‍රිස්තු අනුසාරය

(5) දේව සුබාන්තය

**32.** ආත්මික ප්‍රතිසංස්කරණයන්ට මගපෙන්වීම සඳහා කුරුසියේ ජුවාම්තුමා විසින් රචිත ග්‍රන්ථ දෙකක් වන්නේ,

(1) පූර්ණ දිවියකට මග සහ ඇතුළාන්ත මාලිගාව

(2) පූර්ණ දිවියකට මග සහ කාර්මෙල් සභාවේ නැගුම

(3) ඇතුළාන්ත මාලිගාව සහ ආධ්‍යාත්මික ගීතය

(4) ආත්මික ජීවිතය සහ ආත්මයේ අඳුරු රාත්‍රිය

(5) ප්‍රේමයේ නොනිවෙන ගිනිදළු සහ ආධ්‍යාත්මික ගීතය

**33.** ලියනාර්ඩෝ ඩා වින්චි විසින් සිත්තම් කළ ලෝ ප්‍රකට චිත්‍ර දෙකක් වන්නේ,

(1) අන්තිම රාත්‍රී භෝජනය සහ ලෝකය මැවීම යි.

(2) මොනාලිසා සහ ආදම් මැවීම යි.

(3) අන්තිම රාත්‍රී භෝජනය සහ අවසාන විනිශ්චය යි.

(4) මොනාලිසා සහ අවසාන විනිශ්චය යි.

(5) අන්තිම රාත්‍රී භෝජනය සහ මොනාලිසා ය.

**34.** යුරෝපය තුළ බිහි වූ මුල් විශ්වවිද්‍යාල ත්‍රිත්වයක් වන්නේ,

(1) බොලොඤ්ඤා, පැරිස් සහ හාර්වඩ් විශ්වවිද්‍යාලයයි.

(2) සලමන්කා, පැරිස් සහ ජෙනෝවා විශ්වවිද්‍යාලයයි.

(3) බොලොඤ්ඤා, කේම්බ්‍රිජ් සහ මිලාන් විශ්වවිද්‍යාලයයි.

(4) බොලොඤ්ඤා, පැරිස් සහ සලමන්කා විශ්වවිද්‍යාලයයි.

(5) පැරිස්, කේම්බ්‍රිජ් සහ වියෙන්නා විශ්වවිද්‍යාලයයි.

**35.** ජෝන් මිල්ටන් (විල්රන්) විසින් ලියන ලද නවකථාව වන්නේ,

(1) වන්දනාකරුවන්ගේ ගමන ය.

(2) ක්‍රිස්තු අනුසාරය ය.

(3) නැතිවූ පාරාදීසය ය.

(4) පූර්ණත්වයේ මග ය.

(5) ඇතුළාන්ත මාළිගාව ය.

**36.** තමන්ගේ ආගම වශයෙන් කිතු දහම තෝරාගත් පළමු ආසියාතික රට වන්නේ,

(1) ආර්මේනියාව ය. (2) පිලිපීනය ය.

(3) තුර්කිය ය. (4) ඉරානය ය.

(5) චීනය ය.

**37.** රෝමානු කතෝලික සභාව තුළ සිටිමින් ස්වාධීනව ක්‍රියා කරන සිරියානු සම්ප්‍රදායට අයත් සභාව කුමක් ද?

(1) සීරෝ මලබාර් සභාවයි.

(2) ලතින් සභාවයි.

(3) මාර් තෝමා සභාවයි.

(4) කොප්ටික් සභාවයි.

(5) මලංකාර් සිරියන් ඕර්තඩොක්ස් සභාවයි.

**38.** මතේඕ රිච්චි පියතුමන් විසින් රචිත ග්‍රන්ථය වන්නේ,
(1) ප්‍රැන්සිස් සේවියර්තුමන්ගේ ප්‍රාණපරිත්‍යාගිවරු පිළිබඳ ග්‍රන්ථය ය.
(2) ක්‍රිස්තියානි සභා පිළිබඳ විස්තරය ය.
(3) සත්‍ය දේව ගුණාංගය ය.
(4) බැබලෙන ධර්මය ය.
(5) වන්දනාකරුවන්ගේ ගමන ය.

**39.** පිලිපීන ජනතාවගේ සිත් ඇදගත් ස්පාඤ්ඤ ධර්මදූතයන්ගේ ක්‍රියාකාරකම් මොනවා ද?
(1) ආහාර පාන විධි, වන්දනාව සහ යාච්ඤාව
(2) උත්කෘෂ්ඨවත් මංගල්ල, යාච්ඤාව සහ වන්දනාව
(3) බටහිර ජීවිත ක්‍රමය, වන්දනාව සහ සාන්තුවර භක්තිය
(4) සාන්තුවර භක්තිය, යාච්ඤාව සහ බටහිර ජීවිත ක්‍රමය
(5) උත්කෘෂ්ඨවත් මංගල්ල, වන්දනාව සහ ආහාර පාන විධි

**40.** ශ්‍රී ලංකාව පාලනය කළ යුරෝපීය ජාතිකයන් අධ්‍යාපනයේ වර්ධනය සඳහා උනන්දු වීමට හේතුවක් වන්නේ කුමක් ද?
(1) ඔවුන්ගේ පාලනයට පහසුකම් සැපයීම.
(2) ඔවුන් පාලනය කළ සෑම රටකම අධ්‍යාපනය වැඩිදියුණු කිරීම ඔවුන්ගේ ප්‍රතිපත්තියක් වීම.
(3) ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරයේ (ධර්ම දානයේ) මාර්ගයක් වශයෙන් අධ්‍යාපනය සැලකීම.
(4) රට සංවර්ධනය කිරීමට අධ්‍යාපනය හේතුවක් වීම.
(5) අධ්‍යාපනය මනුෂ්‍යයාගේ මූලික අයිතිවාසිකමක් ලෙස සැලකීම.

**41.** 'මානව උදාරත්වය' ප්‍රධාන තේමාවක් වන දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ලේඛනය වන්නේ,
(1) ජනවන්දනාව පිළිබඳ ප්‍රකාශයයි.
(2) වර්තමාන ලෝකය තුළ ශුද්ධවූ සභාව පිළිබඳ ප්‍රකාශයයි.
(3) ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශයයි.
(4) ජන මාධ්‍යය පිළිබඳ ප්‍රකාශයයි.
(5) පූජක පුහුණුව පිළිබඳ ප්‍රකාශයයි.

**42.** දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් ලියූ සමාජ විශ්ව ලේඛන වන්නේ,
(1) අයුක්තියට පිළිතුර, මනුෂ්‍යයන්ගේ ගැළවුම්කරුවාණෝ සහ දෙවියන් වහන්සේ ප්‍රේමය යි.
(2) වෙහෙසෙන මිනිස්සු, ජනතා ප්‍රගතිය සහ මානව ශ්‍රමය යි.
(3) සියවන වසර, අයුක්තියට පිළිතුර සහ දෙවියන් වහන්සේ ප්‍රේමය යි.
(4) මනුෂ්‍යයන්ගේ ගැළවුම්කරුවාණෝ, මානව ශ්‍රමය සහ සමාජ සැලකිල්ල යි.
(5) ජනතා ප්‍රගතිය, මානව ශ්‍රමය සහ ප්‍රශංසා වේවා මා සමිඳුනි යි.

**43.** ලෝක සභා සම්මේලනය සහ එක්වීමට කැමැත්ත නොදැක්වූ සභා විසින් පිහිටුවා ගත් සංවිධානය වන්නේ,
(1) ලෝක එවැන්ජිකල් සංවිධානයයි.
(2) විශ්වාසය සහ ක්‍රමවත් බව සඳහා වන කොමිසමයි.
(3) ජාත්‍යන්තර මිෂනාරි සංගමයයි.
(4) කිතුනු අධ්‍යාපනය සඳහා ලෝක සංවිධානයයි.
(5) ජීවිතය සහ සේවය සඳහා වන පෙරමුණයි.

**44.** ඉපැරණි ප්‍රසාද ස්නාපන බඳුනක් හමු වූ ස්ථානය කුමක් ද?
(1) අනුරාධපුරය
(2) පොළොන්නරුව
(3) දඹදෙනිය
(4) සීගිරිය
(5) වව්නියාව

**45.** එකමුතු සතිය ලොව පුරා පැතිර වූ ශුද්ධෝත්තම පියතුමා වන්නේ,
(1) IX පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(2) X පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(3) XIII ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
(4) VI පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
(5) XV බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.

**46.** ආසියානු සභාව නැමැති අපෝස්තලික අනුශාසනා පත්‍රයට අනුව දේව අනාවරණය සිදු වූ භූමිය කුමක් ද?
(1) ඔස්ට්‍රේලියාව (2) ආසියාව
(3) යුරෝපය (4) දකුණු ඇමරිකාව
(5) අප්‍රිකාව

● පහත වගුව ඇසුරෙන් අංක **47** සිට **50** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A<br>ගරු ජේ වින්සන් පියතුමා | B<br>වෙස්ලියන් ධර්මදූතවරු | C<br>පිලිප් බල්දෙවුස් දේවගැතිතුමා | D<br>ගරු මයිකල් රුදිගු පියතුමා |
| E<br>අපගේ ආගමේ වැදගත් ආඥා | F<br>සුබසෙත් ගෙදර | G<br>සාන්ත ලෝරන්ස් දේවස්ථානය, කොළඹ | H<br>රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල |

**47.** පෘතුගීසි පාලන සමය හා සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ G ය. (2) A සහ H ය. (3) B සහ E ය. (4) C සහ F ය. (5) D සහ G ය.

**48.** කැල්වින් වාදය හා බැඳුණු යුගලය වන්නේ,
(1) A සහ E ය. (2) B සහ G ය. (3) C සහ E ය. (4) C සහ F ය. (5) D සහ H ය.

**49.** බ්‍රිතාන්‍ය පාලන යුගය හා සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ G ය. (2) B සහ H ය. (3) C සහ E ය. (4) C සහ H ය. (5) D සහ G ය.

**50.** ශ්‍රී ලංකාවේ නිදහසෙන් පසු යුගයට සම්බන්ධ යුගලය වන්නේ,
(1) A සහ E ය. (2) B සහ G ය. (3) C සහ G ය. (4) D සහ F ය. (5) D සහ H ය.

***

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

විෂයය අංකය / பாட இலக்கம்: **49**

විෂයය / பாடம்: **ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 4 | 21. | 2 | 31. | 3 | 41. | 2 |
| 02. | 2 | 12. | 3 | 22. | 1 | 32. | 5 | 42. | 4 |
| 03. | 1 | 13. | 1 | 23. | 4 | 33. | 5 | 43. | 1 |
| 04. | 5 | 14. | 5 | 24. | 4 | 34. | 4 | 44. | 5 |
| 05. | 5 | 15. | 1 | 25. | 4 | 35. | 3 | 45. | 5 |
| 06. | 4 | 16. | 2 | 26. | 4 | 36. | 1 | 46. | 2 |
| 07. | 1 | 17. | 4 | 27. | 3 | 37. | 1 | 47. | 1 |
| 08. | 3 | 18. | 5 | 28. | 5 | 38. | 3 | 48. | 3 |
| 09. | 5 | 19. | 2 | 29. | 4 | 39. | 2 | 49. | 2 |
| 10. | 3 | 20. | 3 | 30. | 2 | 40. | 3 | 50. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

## ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රය

## I කොටස

මෙම දෙවන ප්‍රශ්න පත්‍රයේ පළමු කොටස ප්‍රශ්න තුනකින් සමන්විත ය. එම ප්‍රශ්න තුන අතුරින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයීම ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂා කෙරේ.

1. මෙම පළමු ප්‍රශ්නය කොටස් හතරකින් සමන්විත ය. පළමු කොටස් දෙකින් පළමු කොටසේ රෝම ආගමික සිරිත් විරිත් මගින් ක්‍රිස්තියානි ජන වන්දනාවට වූ බලපෑම පිළිබඳව කරුණු විමසන අතර, දෙවන කොටසින් ගලීල දේශය පිළිබඳව කරුණු විමසීම සිදුවෙයි. තුන්වන සහ හතරවන කොටස් විස්තරාත්මක ඒවා ය. තුන්වන කොටසින් සීනයි කන්ද පාමුල දී දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව සමග කළ ගිවිසුමේ ලක්ෂණ විමසන අතර, හතර වන කොටසින් ඊජිප්තු හා මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ජුදා සංස්කෘතිය ගොඩනැගීමට දායක වූ ආකාරය විමසනු ලබයි.

2. මෙම ප්‍රශ්නය කොටස් හතරකින් සමන්විත ය. ඉන් පළමු කොටස් දෙකින් අදාළ විෂය සම්බන්ධව කරුණු විමසන අතර, තුන්වන හා හතරවන කොටස්වලින් කෙටි විස්තර අපේක්ෂා කෙරේ. ජුදා සමාජය ගැන වූ පළමු කොටස් දෙකින් ඊශ්‍රායෙලයේ දෙවියන් වහන්සේ හැඳින්වීමට භාවිතවන නම් හතරක් ද, ගලීලයේ භූගෝලීය ලක්ෂණ හතරක් ද විමසනු ලබයි. ජුදා සමාජයේ කාන්තාව කොන් වූ අයෙකි. නිදහස සීමා වූ අයෙකි. තුන්වන කොටසින් කෙටි විස්තරයක් අසන්නේ ජුදා සමාජයේ කාන්තාවන් ගැනයි. හතරවන කොටසින් අර්කෙලාවුස්, පිලිප් සහ හොරෝද් ඇන්ටිපස් ගැන ද ක්‍රිස්තුන් වහන්සේ ද විසූ එසමයෙහි පැවැති දේශපාලන තත්ත්වය ගැන ද කෙටි විස්තරයක් අපේක්ෂා කෙරේ.

3. තුන්වන ප්‍රශ්නය කොටස් හතරකින් යුත්ක වේ. පළමු කොටස් දෙකින් විෂය පිළිබඳ දැනුම විමසන ක්ෂේත්‍ර ලිවීම අපේක්ෂා කරන අතර, තුන්වන සහ හතරවන කොටස් කෙටි විස්තර ලිවිය යුතු ඒවා වෙයි. එකිනෙකට වෙනස් වූ මෙකී කොටස්වල පළමු වැන්නෙන් යුරෝපයේ බිහිවූ ක්‍රිස්තියානි සංගීත වර්ග හතරක් නම් කිරීම ද, දෙවැන්නෙන් පෘතුගීසීන් ලංකාවට පැමිණීමට හේතු වූ කරුණු හතරක් ද විමසයි. තුන්වන කොටසින් ශ්‍රී ලංකාවේ දිගු කාලයක් විසූ ශ්‍රේෂ්ඨ පඬිරුවනක් හා සමාජ සේවකයෙකුවූ පිටර් පිලිලේ පියතුමා ගැන විස්තරයක් අපේක්ෂා කරන අතර, හතරවන කොටස මගින් මධ්‍යතන යුගයේ විසූ ශ්‍රේෂ්ඨ දර්ශනවාදියෙකු හා දේව ධර්ම ශාස්ත්‍රඥයකු වූ තෝමස් ඇක්වයිනස්තුමා ගැන විස්තරයක් අපේක්ෂා කෙරේ.

## II කොටස

4. හතරවන ප්‍රශ්නය ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය, මරණය හා උන්වහන්සේ පිළිබඳ කරුණු දැන ගැනීම සඳහා වෙන් වෙයි. පළමු කොටසින් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම හා මරණය සම්බන්ධයෙන් ශුද්ධවූ ජොහාන් සුවිශේෂයේ සඳහන් කරුණු විමසයි. දෙවන කොටසින් ක්‍රිස්තු වහන්සේගේ උත්ථානය ක්‍රිස්තියානිවරුන්ට ඔවුන්ගේ ඇදහිල්ල වර්ධනය කර ගැනීමට උපකාරීවන අන්දම පිළිබඳව ප්‍රායෝගික කරුණු ලිවීම අපේක්ෂා කෙරේ.

5. ක්‍රිස්තියානි සභාවට දානය කරන ලද උතුම්ම ත්‍යාගය ශුද්ධාත්මයාණෝය. මුල් ක්‍රිස්ත්‍රියානි සභාව සිය සෑම කාර්යයකදීම ශුද්ධාත්මයාණන්ගේ මග පෙන්වීම සෙවූ ආකාරය පළමු කොටසින් විමර්ශනය කෙරෙයි. ලෝකය තුළ ජීවත්වීමේදී වර්තමානයේ ද ක්‍රිස්තියානීන් විසින් ශුද්ධාත්මයාණන්ගේ බලය සහ මග පෙන්වීම සෙවිය යුත්තේ මන්දැයි විස්තරයක් ලිවීම දෙවන කොටසින් අපේක්ෂා කෙරෙයි.

6. සභාවේ ආරම්භයේ සිට වර්තමානය දක්වාම සභාවට විවිධාකාර පීඩාවනට මුහුණ දීමට සිදුව ඇත. මෙම හයවන ප්‍රශ්නයේ පළමු කොටස මගින් පළමු ශත වර්ෂ හතර පුරා ක්‍රිස්තියානීන්ට විඳීමට සිදුවූ විවිධ පීඩා ගැන විෂය දැනුම විමසන අතර, දෙවන කොටසින් පීඩා හමුවේ ක්‍රිස්තියානීන් දක්වන ප්‍රතිචාරය ලෝකය තුළ ප්‍රේමය, සහෝදරත්වය සහ සමාවේ පණිවුඩය ගෙන යාමට උපකාරී වී ඇති ආකාරය පිළිබඳ විස්තරයක් කිරීම අපේක්ෂා කෙරේ.

7. මධ්‍යතන යුගය සමයේ සාමාජයේ වර්ධනයට බොහෝ දේ සිදු වුව ද එය සභාව ලෞකිකත්වය කරා ගමන් කළ යුගය ද වෙයි. මෙම ප්‍රශ්නයේ පළමු කොටසින් එම අවධියේ බිහි වූ යාචක නිකා නමින් හැඳින්වෙන නව පැවිදි නිකා ගැන සඳහන් කර ආධ්‍යාත්මික වර්ධනයට ඒවායින් සිදු වූ සේවාව පිළිබඳව දැක්වීම අපේක්ෂා කෙරෙයි. දෙවන කොටසින් අපේක්ෂා කෙරෙන්නේ ක්‍රිස්තුන්වහන්සේ සහ අපෝස්තුලුවරුන් තුළ වූ දිළිඳුකම වත්මන් ලෝකය තුළ ද ගැලවීමේ සලකුණක් ලෙස භාවිත කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ විස්තරයක් ලිවීමයි.

8. අටවන ප්‍රශ්නය මානව උදාරත්වය ගැන විමසීමකට වෙන් වෙයි. පළමුවන කොටසින් මානව උදාරත්වය ගැන වූ දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් ගැන විමසන අතර, දෙවන කොටසින් මානව උදාරත්වය වත්මන් සමාජය තුළ ද කෙලෙසෙන ආකාරය ගැන නිදසුනක් ඉදිරිපත් කර මානව උදාරත්වය රැක ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග මොනවාදැයි දැක්වීම අපේක්ෂා කෙරෙයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) කිතුනු ජනවන්දනාවට බල පෑ රෝම ආගමික සිරිත් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

   (ii) ගලීලය ප්‍රදේශයේ පිහිටි භූගෝලීය සාධක **හතරක්** දක්වන්න. (ලකුණු 4යි)

   (iii) සීනයි ගිවිසුමේ ලක්ෂණ මොනවා දැයි විස්තර කරන්න. (ලකුණු 6යි)

   (iv) ඊජිප්තු සහ මෙසපොතේමියානු ශිෂ්ටාචාර, ජුදා සංස්කෘතිය කෙරෙහි බල පෑ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

2. (i) ඊශ්‍රායලයේ දෙවියන්වහන්සේ හඳුන්වන ලද නම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

   (ii) ජුදා යාච්ඤාවල දැකිය හැකි ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 4යි)

   (iii) ක්‍රිස්තුන්වහන්සේගේ කාලයේදී ජුදා සමාජයේ කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 6යි)

   (iv) අර්කෙලාවුස්, පිලිප් සහ හෙරෝද් ඇන්ටිපස්ගේ පාලනය ඇතුළුව, ක්‍රිස්තුන්වහන්සේගේ කාලයේ පැවති දේශපාලන තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

3. (i) ක්‍රිස්තියානි සංගීත වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 2යි)

   (ii) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූ කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 4යි)

   (iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට පීටර් පිල්ලේ පියතුමන්ගේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 6යි)

   (iv) ශුද්ධ වූ තෝමස් ඇක්වයිනස්තුමන්ගේ ඉගැන්වීම් මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

## II කොටස

4. (i) ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය සහ මරණය පිළිබඳව සුවිශේෂක ජොහාන්තුමන්ගේ ඉගැන්වීම ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

(ii) ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ උත්ථානය ක්‍රිස්තියානිවරුන්ට ඔවුන්ගේ ඇදහිල්ල වර්ධනය කර ගැනීමට උපකාරී වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

5. (i) විශේෂ තීරණ ගැනීමේදී සහ ශුභාරංචිය පතල කිරීමේදී මුල් සභාව සැමවිටම ශුද්ධාත්මයාණන් කෙරෙහි විශ්වාසය තබා ක්‍රියා කළ ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) වත්මන් ලෝකය තුළ කිතුනු සාක්ෂ්‍ය, ශුද්ධාත්ම බලය හා මගපෙන්වීම මත පදනම් විය යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

6. (i) පළමු සියවස් හතර තුළ ක්‍රිස්තියානිවරුන් අත් විඳී විවිධාකාර පීඩන මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) "අත් විඳීමට සිදුවන පීඩන හමුවේ කිතුනුවන් දක්වන ලද ප්‍රතිචාරය වර්තමාන ලෝකයට ප්‍රේමයේ, සමාවේ සහ සහෝදරත්වයේ පණිවුඩයක් ගෙන ඒමට සමත් වී ඇත." අදහස් දක්වන්න. (ලකුණු 10යි)

7. (i) යාචක පැවිදි නිකා නම් කර, එම කාලයේ පිරිහී තිබූ සභාවේ අධ්‍යාත්මිකත්වය වර්ධනයට එම නිකායන් සිදු කළ සේවා පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) 'සුවිශේෂක දිළිඳුකම' සැමවිටම සභාව ලෝකය තුළ ගැලවීමේ සලකුණක් වීමට උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

8. (i) 'මානව උදාරත්වය' සම්බන්ධයෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) මානව උදාරත්වය කෙළසූ අවස්ථා **දෙකක්** සඳහන් කර, මානව උදාරත්වය ආරක්ෂා කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *

## I කොටස

1. (i) කිතුනු ජනවන්දනාවට බල පෑ රෝම ආගමික සිරිත් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

(01) I

- රෝමවරුන් තම දෙවිවරුන්, වීරවරුන් හා රජවරුන් වෙනුවෙන් උත්සව පැවැත්වීම, එලෙසම කිතුණුවන්ද තම ප්‍රාණපරිත්‍යාගීවරුන් හා ශුද්ධවන්තයන් වෙනුවෙන් මංගල්‍යයන් පැවැත්වීම
- රෝමවරුන් දෙසැම්බර් 25වන දින සූර්ය මංගල්‍යය පැවැත්වූ අතර කිතුණුවන් එදිනට ජේසු ක්‍රිස්තුස් වහන්සේගේ උපන් මංගල්‍යය පැවැත්වීම
- ජන වන්දනාවට ලතින් භාෂාව යොදා ගැනීම
- රෝම ලතින් ජන වන්දනා ක්‍රමය බිහි වීම
- යැදුම් හා පෙරහැර ආදී රෝම සම්ප්‍රදායයන් කිතුණු ජන වන්දනාවට එක්වීම
- රෝම රජවරුන් හා හමුදා නිළධාරීන්ගේ සම්ප්‍රදායයන් හා ඇඳුම් පැළඳුම් කිතුණු ජනවන්දනාවට ඒකවීම
- දණ ගැසීම හා දණ නමා ආචාර කිරීමේ ක්‍රමය

(ii) ගලීලය ප්‍රදේශයේ පිහිටි භූගෝලීය සාධක **හතරක්** දක්වන්න. (ලකුණු 4යි)

II

- පලස්තීනය ඉතා සශ්‍රීක ප්‍රදේශයකි
- වෙරළබඩ තීරය, බටහිර කඳු, ජෝර්දාන් නිම්නය, නැගෙනහිර කඳු
- ගලීලය ඉහළ හා පහල ලෙස කොටස් දෙකකට බෙදී පැවතීම
- පලස්තීනයේ දැකිය හැකි ඉතා උස්වූ කඳු පන්තිය ගලීලය ඉහල කොටසේ පිහිටා තිබීම
- කුඩා ගල්වැටි හා සශ්‍රීක ප්‍රදේශ ගලීලයේ පහල කොටසේ පිහිටා තිබීම
- නාසරතය, කානා, නායිම්, කපර්නාවුම්, තිබේරිය, බෙත්සයිදා, තාබෝර් කන්ද වැනි ප්‍රධාන ස්ථාන ගලීලයේ පිහිටා තිබීම
- ගලීල මුහුද පිහිටා තිබීම

(iii) සීනයි ගිවිසුමේ ලක්ෂණ මොනවා දැයි විස්තර කරන්න. (ලකුණු 6යි)

III

- දෙවියන් වහන්සේව හඳුනා ගැනීම
- උන්වහන්සේ ඊශ්‍රායල් ජනතාවට කල අරුම පුදුම ක්‍රියා දැන ගැනීම
- ආඥා සහ වගකීම්

- ගිවිසුම් පත්‍රය කියවීම
- භෝජන සංග්‍රහය පැවැත්වීම
- ශුද්ධ වූ ස්ථානයක ගිවිසුම් පත්‍රය සුරක්ෂිතව තැබීම
- සාක්ෂ්‍ය සහ ආශිර්වාදය
- සාමාන්‍ය එබ්රෙව්වන් ලෙස ජීවත් වූ ඊශ්‍රායල් ජනතාව දෙවියන් වහන්සේට අයිති රාජකීය, පූජක, ශුද්ධ වූ ජනතාවක් බවට පත් විම

(iv) ඊජිප්තු සහ මෙසපොතේමියානු ශිෂ්ටාචාර, ජුදා සංස්කෘතිය කෙරෙහි බල පෑ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

IV **ඊජිප්තු ශිෂ්ටාචාරය**

- රාජ්‍ය පාලන බලය දෙවියන්ගෙන් රජුන්ට ලැබෙන බව විශ්වාස කිරිම
- රජු ආත්මික හා ලෞකික නායකයෙකු ලෙස පිළිගැනීම
- ආගමික පූජකවරු රජුට පසු වැදගත් පුද්ගලයන් ලෙස සලකනු ලැබීම
- පාලනය, ආගම, ආර්ථිකය යන වගකීම් ඒකාබද්ධ කිරිම
- පාලන බලය පියාගෙන් පුතුට හිමිවීමේ සම්ප්‍රදාය පැවතීම
- දෙවිවරුන් හා අශුද්ධාත්මයන් පිළිබඳ විශ්වාසයන් පැවතීම
- අවමංගල්‍ය සිරිත් විරිත් හා ඒවායේ දී භාවිතා කල යාච්ඤාවන්
- මරණින් මතු ජීවිතයක් ඇති බවට පැවති විශ්වාසය
- ගොඩනැගිලි, මූර්ති, චිත්‍ර කලාව ද, රූපාක්ෂර ආදිය ද බලපාන ලදි
- රජවරු, පාරාවෝ යන පොදු නාමය භාවිත කිරීම

**මෙසපොතේමියානු ශිෂ්ටාචාරය**

- නායකත්වයට පාලනය කිරීමේ බලය, දෙවියන් වහන්සේ විසින් දෙන බව විශ්වාස කිරීම
- රාජය පාලනය සඳහා අවශ්‍ය මූල්‍ය ආදායම බදු අය කිරීමෙන් ලබා ගැනීම
- හමුරාබිගේ නීති සම්පාදනයේ බලපෑම
- මර්ඩොක්, ඉදා, සින්, සමාස් වැනි දෙවිවරුන් කෙරෙහි තිබූ විශ්වාසය
- අශුද්ධාත්මයන් මනුෂ්‍යයාට පීඩා කිරීම පිළිබඳව පැවති විශ්වාසය
- අශුද්ධාත්මයන්ගේ ක්‍රියා නවතාලීම පූජකවරුන් විසින් සිදුකිරීම

ගන්

සුවකල හැකි බව විශ්වාස කිරීම

- සුමේරියාවේ මූර්ථි කලාවේ දියුණුව
- සෑම දෙයකටම වෙන් වූ දෙවිකෙනෙක් ඇති බව විශ්වාස කිරීම
- මිනිසා ගැලවීමේ බලය දෙවිවරුන්ට පමණක් ඇති බව විශ්වාස කිරීම

2. (i) ඊශ්‍රායලයේ දෙවියන්වහන්සේ හඳුන්වන ලද නම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 2යි)

(02) I

- එල් එලෝහිම්
- එල් එලියොන්
- එල් ෂඩායි
- යාවේ
- අදෝනායි

(ii) ජුදා යාච්ඤාවල දැකිය හැකි ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 4යි)

II

- යාග ඔප්පු කිරීම ඔවුන් යාච්ඤාව ලෙස පිළිගැනීම
- දෙවියන් සමඟ කරන කථාවක් ලෙස පිළිගැනීම
- 'ක්ෂේමා' යන අර්ථය ඇතිව යාච්ඤාවෙහි නියැලීම
- දිනකට තුන් වරක් යාච්ඤා කිරීම (උදේ, දවල් සහ සවස)
- ප්‍රශංසා යැදුම් 18කින් සමන්විත වීම
- යාච්ඤා කරන විට 'තෙපිලින් 'යන දේව වචනය අඩංගු සමින් සාදන ලද පෙට්ටියක් පැළඳ සිටීම. 'තාලින් ' සළුවෙන් සැරසී සිටීම
- ජෙරුසෙලම දෙස බලා දනින් වැටී දෑත් ඔසවා මහ හඬින් යාච්ඤා කිරීම
- දේව මාළිගයේ හා ධර්ම ශාලා වල යාච්ඤා කිරීම

(iii) ක්‍රිස්තුන්වහන්සේගේ කාලයේදී ජුදා සමාජයේ කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 6යි)

III

- කාන්තාවන් සමාජය හා වැඩි ඇසුරක් නොදැක්වීම
- ඔවුන්ව ඉතා පහත් කොට සලකනු ලැබීම
- සමාජයේ නිසි තැනක් නොලැබීම
- ආගමික හා දේශපාලන වශයෙන් ඔවුන්ව කොන් කරනු ලැබීම

- නිවසින් බැහැර යන විට හිස හා මුහුණ වසා ගෙන යා යුතු වීම
- විවිධ හේතුන් මත ස්වාමිපුරුෂයාට භාර්යාව දික්කසාද කල හැකි වීම
- කිසිම කාන්තාවක් තම පවුලේ අයෙකු හැරෙන්නට වෙනත් පිරිමියෙකු සමඟ තනිව සිටීම තහනම් වීම
- කිසිම භාර්යාවකට තම ස්වාමිපුරුෂයා පිළිබඳ නීතිමය අධිකාරි බලයක් නොමැතිවීම

- ස්වාමිපුරුෂයාගේ පෞද්ගලික වස්තුවක් ලෙස සළකනු ලැබීම
- දික්කසාදය සඳහා පුරුෂයන්ට නීතිමය අනුමැතියක් තිබීම
- කාන්තාවන් පිරිමින් හා එක්ව ආහාර අනුභව කිරීම තහනම් වීම
- යාච්ඤා කරන ස්ථානවල කාන්තාවන්ට වෙන්කල ස්ථානයක් තිබීම
- වැන්දඹු කාන්තාවන් බොහෝ පීඩාවන්ට ලක් විම
- රැකියාවක් කිරීමට ඔවුන්ට නොහැකි වීම

(iv) අර්කෙලාවුස්, පිලිප් සහ හෙරෝද් ඇන්ටිපස්ගේ පාලනය ඇතුළුව, ක්‍රිස්තුන්වහන්සේගේ කාලයේ පැවති දේශපාලන තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

IV **අර්කෙලාවුස්**

- පලස්තීනයේ අඩක්ම (ජුදයාව, සමාරිය හා ඉඳුමිය) මොහු යටතේ පැවතීම
- මොහු ආණ්ඩුකාරයා ලෙස ක්‍රියා කිරීම
- තම අභිමතය පරිදි නායක පූජකවරුන් මාරු කිරීම
- තනතුරුවලට කෑදර වීම
- තම පියාගෙන් පසුව රජකමට පත් වීම
- ජුදා හා සමාරිය නිලධාරීන් සමඟ ගැටීම

**පිලිප්**

- ගලීලයේ නැගෙනහිර ප්‍රදේශවලටත් උතුරු ප්‍රදේශවලටත් යුවරජු ලෙස කටයුතු කිරීම
- නීති ගරුක හා අවංකව පාලනය කිරීම
- බෙත්සයිදාව තම අගනුවර කොට ගැනීම
- වසර 37ක් රජකම් කිරීම

**හෙරෝද් අන්තිපස්**

- ගලීලය හා පෙරයාවේ යුවරජු ලෙස පාලනය කිරීම
- 'තිබේරියා' නමින් විශාල අගනුවරක් ගොඩ නැගීම
- පියාමෙන් නපුරු ගති ගුණවලින් යුතු වීම
- ජේසුස් වහන්සේ ඔහුට 'හිවලා' යන අනුවර්ථන නාමයෙන් හැඳින්වීම

**ජේසු සමයේ පලස්තීනයේ දේශපාලන තත්ත්වය**

- හෙරෝද්වරුන්ට පසුව රෝම පාලකයෝ පලස්තීනය පාලනය කරන ලදී.
- රෝම ආණ්ඩුකාරවරු මධ්‍යධරණී සෙසරියාවේ විසූහ. මොව්හූ ජුදා මංගල්‍ය කාලවල ජෙරුසලෙමට පැමිණියහ. ඊට හේතුවූයේ විනය සහ සාමය පවත්වාගෙන යාමටය.

- ජේසුස් වහන්සේගේ උපත සිදුවූයේ අගුස්තුස් සේසරු අධිරාජ්‍ය සමයේදීය.
- ආණ්ඩුකාරවර පොන්සියෝ පිලාත් විසින් ජේසුතුමා කුරුසියේ මරණයට පාත්‍ර කරන ලදී.

**3.** (i) ක්‍රිස්තියානි සංගීත වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 2යි)

(03) I

- ග්‍රෙගෝරියානු සංගීතය
- පොලිෆොනී සංගීතය (මිශ්‍රතාල)
- ඔරතෝරියානු සංගීතය
- බරොක් සංගීතය

(ii) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට හේතු වූ කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 4යි)

II

- පෙරදිග වෙළඳාමෙන් ලද ආදායම සියළුම අයිතිවාසිකම් අරාබිවරුන්ගෙන් මුලුමනින්ම අත්පත් කර ගැනීම
- ආර්ථික වශයෙන් ලාභ ලැබීම
- කතෝලික ආගම ප්‍රචාරය කිරීම
- තම පාලනය විවිධ රටවල පැතිරවීම

(iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට පීටර් පිල්ලේ පියතුමන්ගේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 6යි)

III

- කොළඹ ශාන්ත පීතර විදුහලේ ගුරුවෘත්තියේ නියැලීම
- 1936 දී කතෝලික සමාජ සේවා සංගමය ආරම්භ කිරීම
- 1940 දී කොළඹ ශාන්ත ජෝසප් විදුහලේ පස්වන විදුහල්පති ලෙස පත්වීම
- සුදුසුකම් සහිත උසස් පෙළ සිසුන් උසස් අධ්‍යාපනය සඳහා යොමු කිරීම
- 1954 දී ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය කොළඹ බොරැල්ලෙහි පිහිටුවාලීම
- එහි පළමු විදුහල්පති ලෙස සේවය කිරීම

අධ්‍යාපනයට මග පෑදුණි

- කොළඹ සිටි සියළුම අධ්‍යාපනඥයින් එක්කොට ස්වේරියන්ස් (Xaverians) නමින් අධ්‍යාපනඥයින්ගේ සංගමයක් ආරම්භ කිරීම
- සමාජ නීතිය කේන්ද්‍ර කරගනිමින් ග්‍රන්ථ 14 පමණ රචනා කිරීම

- ගොඩනැගිලි නිර්මාණකරුවෙක්, සමාජ සේවකයෙක් සහ චින්තකයෙකු වශයෙන් දායක වීම
  (මෙතුමාගේ සේවය වෙනුවෙන් ලංකා රජය මෙතුමාගේ රුව සහිත මුද්දරයක් එළි දැක්වීම)

(iv) ශුද්ධ වූ තෝමස් ඇක්වයිනස්තුමන්ගේ ඉගැන්වීම් මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 8යි)

IV

- දෙවියන් වහන්සේ පිළිබඳ ඉගැන්වීම
- මැවීම පිළිබඳ ඉගැන්වීම
- සදාතන ජීවිතය පිළිබඳ ඉගැන්වීම
- දෙවියන් වහන්සේගේ ස්වභාවය පිළිබඳව ඉගැන්වීම
- 'සියල්ල දෙවියන් වහන්සේගෙන් නික්මෙන්නේය' යන්න පිළිබඳ හැඳින්වීම
- චින්තන හැකියාවෙන් යුත් මිනිසා අවසානයේ දෙවියන් හා එක්වන්නේය යන්න ඉගැන්වීම

## II කොටස

4. (i) ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය සහ මරණය පිළිබඳව සුවිශේෂක ජොහාන්තුමන්ගේ ඉගැන්වීම් ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

(04) I

- සදාතනික ජීවිතය ලබා දීමට දෙවියන් වහන්සේ විසින් එවනු ලැබූ තැනැත්තා ජේසුස් වහන්සේය. (ජොහාන් 10: 10, 17-18)
- 'යමෙකු තම මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත' (ජොහාන් 15:13)
- 'ජේසුස් වහන්සේ අවසානය තෙක්ම ජනතාවට ප්‍රේම කර දිවි පිදූ සේක' (ජොහාන් 13:1)
- දේව එළිදරව්වේ උච්චතම අවස්ථාව ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා මරණයයි.
- උන්වහන්සේගේ මරණය, දෙවියන් වහන්සේට කීකරුවීමේ සළකුණකි.
- ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට වගකිව යුත්තෝ රෝම වරු නොව ජුදාවරුය.

- එය දේව කැමැත්ත ඉටු කිරීමේ අරමුණින් කළ සේක.
- ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය පාමුල ජොහාන්තුමා සහ මරිමව සිටියහ.
- ක්‍රිස්තුස් වහන්සේගේ මරණය තමන්වහන්සේ දෙව් පියාණන් මගින් මහිමයට පත් කිරීමකි.

(ii) ජේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ උත්ථානය ක්‍රිස්තියානිවරුන්ට ඔවුන්ගේ ඇදහිල්ල වර්ධනය කර ගැනීමට උපකාරී වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

II

- කිතුණු ජීවිතය මරණයෙන් අවසන් නොවේ.
- මෙලොව ජීවිතය ලෞකික ජීවිතයට පමණක් සීමා නොවේ.
- පාවුළු තුමාගේ ඉගැන්වීමට අනුව ක්‍රිස්තුස් වහන්සේ උත්ථාන නොවන්නට අපගේ විශ්වාසයට අර්ථයක් නැත. ශුභ අස්න දේශනා කිරීමට ද අර්ථයක් නැත.
- ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය කිතුණු ජීවිතය තුල බලාපොරොත්තුව ඇති කරයි.
- කිතුණු ජීවිතය වනාහී තමා වෙනුවෙන් ජීවත් වීම නොව අන් අය වෙනුවෙන් වැය වීමයි. එබැවින් උත්ථානය වනාහී පරිත්‍යාග ජීවිතය සඳහා වන උතුම්ම ආනුභාවය වේ.

5. (i) විශේෂ තීරණ ගැනීමේදී සහ ශුභාරංචිය පතල කිරීමේදී මුල් සභාව සැමවිටම ශුද්ධාත්මයාණන් කෙරෙහි විශ්වාසය තබා ක්‍රියා කළ ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(05) I

- මුල් සභාව සැම විටම යාච්ඤාවේ නියැලී සිටීම.
- ශුද්ධාත්ම බලයෙන් පිරි, ශුභාරංචිය දේශනා කිරීම.
- මන්ත්‍රණ සභාවට ගෙන ගිය විට ශුද්ධාත්ම බලය කෙරෙහි සැමවිට විශ්වාසය තැබීම.
- ක්‍රිස්තුන් වහන්සේම උන්වහන්සේව හැඳින්වූයේ සත්‍යතාවයේ ආත්මයාණන් වශයෙනි. එලෙසම ස්වර්ගයෙන් ලැබෙන බලයෙන් සන්නද්ධ වන තුරු ජෙරුසලෙමෙන් පිටතට නොයෙන ලෙස තම ශ්‍රාවකයන්ට එතුමා වදාළ සේක.
- උන්වහන්සේගේ මේ නියමය අනුගමනය කරමින් ශ්‍රාවකයෝ හා අනෙකුත් කිතුණු අනුගාමිකයෝ ක්‍රියා කළහ.
- ශුද්ධාත්මයන් ලබාගත් අපෝස්තුළුවරු කිසිදු බියකින් තොරව වීදි වලට බැස උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ගැන දේශනා කලහ.
- තමා ගැන එතරම් නොතැකූ ක්‍රිස්තියානි ජනතාව තමා සතු දේ විකුණා දුගීන්ට දී පොදු ජීවිතයක් ගත කළහ.
- මුල දී සමාජය ඉදිරියට යාමට බියවූ හා ක්‍රිස්තුන් වහන්සේගේ මරණය පිළිගැනීමට අකැමති වූ ශ්‍රාවකයන් ක්‍රිස්තුන් වහන්සේ ගැන දේශනා කරන විට ඔවුන්ව අල්ලා ගෙන ගොස්

ිතුර

වූයේ තමන් දන්නා සත්‍යය ප්‍රකාශ කළ යුතු බවයි.

- ස්තේපන් තුමා ගැන සඳහන් කිරීමේදී ද එතුමා ශුද්ධාත්මයාණන්ගෙන් පිරී අරුම පුදුම දේ සිදුකළ ආකාරයත් නිර්භීතව ක්‍රිස්තුන් වහන්සේ ගැන දේශනා කළ ආකාරයත් ක්‍රියා පොතේ සඳහන් වේ.

- පේදුරු තුමා දේශනා කරද්දී එයට සවන් දුන් සියල්ලන්ට ශුද්ධාත්මයන් පහළ වූ ආකාරය ක්‍රියා පොතේ 10 වන පරිච්ඡේදයේ සඳහන්ව ඇත. එසේ ශුද්ධාත්මයන් ලැබූ සියල්ලෝම අන්‍ය භාෂා වලින් කතා කරන්නටත් දේව මහිමය ප්‍රකාශ කරන්නටත් පටන් ගත්හ.
- මුල් සභාවෙහි අපට දක්නට ඇති විශේෂත්වයක් නම් සෑම කාර්යකදීම ශුද්ධාත්මයන්ගේ මඟ පෙන්වීම සෙවූ ආකාරයයි.
- ශුද්ධ පාවුළුතුමාන්ගේ ඉගැන්වීම තුළද ශුද්ධාත්ම මඟ පෙන්වීම හා ක්‍රියා කිරීම කැපී පෙනෙයි.

  නිදසුන් ලෙස ශුද්ධ පාවුළුතුමා යමක් කිරීමේ දී 'ශුද්ධාත්මයාණන් කියූ ආකාරයට' යන යෙදුම නිතර භාවිතා කරයි.

(ii) වත්මන් ලෝකය තුළ කිතුනු සාක්ෂ්‍ය, ශුද්ධාත්ම බලය හා මගපෙන්වීම මත පදනම් විය යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

II ඉහලින් බලයක් ලැබෙන තෙක් ජෙරුසලමින් පිටත නොයන ලෙස ශ්‍රාවකයන්ට පැවසූ ක්‍රිස්තුන් ස්වාමින්වහන්සේ, ඔබව මන්ත්‍රණ සභාවට අල්ලා ගෙන ගිය හොත් කියන්නේ මොනවාදැයි මගදී නොසිතන ලෙස ද, ඔබ කිව යුතු දේ ශුද්ධාත්මයාණන් ඔබට කියනු ඇතැයි යනුවෙන් ද ප්‍රකාශ කළ සේක.

සැබවින්ම අප නියැලෙන්නේ අපගේම ක්‍රියාවක නොවේ. ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් කරන ක්‍රියාවකය. අප සාක්ෂි දරන්නේ උන්වහන්සේගේ ප්‍රේමයටය. උන්වහන්සේ තම මරණය සහ උත්ථානය මඟින් ලබා දුන් නව ජීවිතයටය. එහෙයින් අපට අපේම මනුෂ්‍ය ශක්තිය මත පමණක් විශ්වාසය තබා එය නොකළ හැකිය. ජේසුස් ස්වාමීන්වහන්සේ පවා යම් විශේෂ කාර්යක් ඉටු කිරීමට පෙර මුළු රාත්‍රියම යාච්ඤාවෙන් ගත කළ බව ශුද්ධ සුවිශේෂය අපට පෙන්වා දෙයි. විශේෂයෙන්ම වත්මන් ලෝකය තුළ කිතුණුවන්ට එල්ල වන බාධක බොහෝය. කිතුණු වටිනාකම් අනුව ජීවත් වීමේදී අපට මුහුණ පාන්නට සිදුවන ගැටලු රාශියකි. සමාජය ද බොහෝ ලෙස දූෂිත වී තිබෙන සැටි අපට දැකිය හැක. එහෙයින් එවැනි තත්වයක් මැද නිවැරදිව ක්‍රියා කළ යුතුය.

6. (i) පළමු සියවස් හතර තුළ ක්‍රිස්තියානිවරුන් අත් විඳි විවිධාකාර පීඩන මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(06) I

- ජුදා පීඩනය
- රෝම අධිරාජ්‍යය යටතේ පීඩනය

ක්‍රිස්තියානි ධර්මය ආරම්භ වූ සමයේ එහි ස්වභාවය ගැන ජුදා නායකයන්ට මෙන්ම

නොතිබුණි. මුල් කාලයේදී අපොස්තුළුවරු පවා ජුදා වන්දනා ක්‍රමය අනුගමනය කළ අතර පේදුරු තුමන් හා ජුවාම් තුමන් සවස 03ට පමණ ජෙරුසලෙම් දේව මන්දිරයට යාමෙන් ඒ බව පෙනේ.

එහෙත් ක්‍රමයෙන් ක්‍රිස්තියානීන්ගේ වන්දනා පිළිවෙත්, ජීවිත ක්‍රමය සහ හැසිරීම ජුදා ආගමිකයන්ට වඩා වෙනස් බව ජුදා නායකයන් විසින් වටහා ගත්විට ඔවුහු ක්‍රිස්තියානීන්ට පීඩා කිරීම ඇරඹුවේය. එය උච්චස්ථානයට පත්වූයේ ස්ටේපන් තුමාව ගල් ගසා මරා දැමීමත් සමඟය. ඒ හා සමඟ පෙරුසලෙම පුරා ක්‍රිස්තියානීන්ට පීඩා කිරීම ඇරඹූ බව ක්‍රියා පොතේ සඳහන් වේ.

ජුදා නායකයන්ගේ සිත් දිනා ගැනීම පිණිස හෙරෝද් රජු විසින් ජාකොබ් තුමන්ව මරා දමන ලදි. ඒ ගැන ප්‍රදානීන් සතුටු වූ බව දැන පේදුරුතුමාව ද අල්ලා සිර කරනු ලැබීය.

පාවුළු තුමාගේ සිත් හැරීම සිදුවූයේ ද දමස්කයේ සිට ක්‍රිස්තියානීන් හිර අඩස්සියට ගැනීමට යන අවස්ථාවේදී ය.

**රෝම පීඩා**

මෙය ත්‍රිවිධාකාර වේ.

1. ප්‍රතිපත්ති පීඩන
2. අවස්ථානුකූල පීඩන
3. රාජ්‍ය පීඩන

මෙකී පීඩන නීරෝ අධිරාජ්‍යයාගෙන් ආරම්භ වී ක්‍රිස්තු වර්ෂ 312 දී දියොක්ලේසියානු අධිරාජ්‍යයා දක්වා සිදුකරන ලදී.

රෝම පීඩා වලට පාදක වූයේ ක්‍රිස්තියානීන් ගැන පැතිර වූ අසත්‍ය ආරංචි වේ. එලෙසම ක්‍රිස්තියානීන්ගේ හැසිරීමේ වෙනස නිසා රෝම අධිරාජ්‍යයේ නායකයෝ ද ක්‍රිස්තියානීන්ට විරුද්ධව පීඩා දියත් කළහ. මෙකී පීඩන වසර 250ක් පමණ තිස්සේ අධිරාජ්‍යවරුන් 10 දෙනෙකු යටතේ සිදුවිය. ක්‍රිස්තියානීන්ට කළ පීඩා ද විවිධාකාරය. ඉන් කිහිපයක් නම් එල්ලා මරා දැමීම, සතුන්ට ආහාර ලෙස දැමීම, හිස ගසා මරා දැමීම, වද හිංසා වලට ලක් කිරීම, වීදි වල ආලෝකකරණයට පහන් සේ පිළිස්සීම, ඇස් ඉගිල්ලීම වේ.

(ii) "අත් විඳීමට සිදුවන පීඩන හමුවේ කිතුනුවන් දක්වන ලද ප්‍රතිචාරය වර්තමාන ලෝකයට ප්‍රේමයේ, සමාවේ සහ සහෝදරත්වයේ පණිවුඩයක් ගෙන ඒමට සමත් වී ඇත." අදහස් දක්වන්න. (ලකුණු 10යි)

II ඇසට ඇස, දතට දත යන සංකල්පය පුරාණ ගිවිසුමේ නීති අතර දිස්වුව ද, ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් වූයේ ඔබේ සතුරාට ප්‍රේම කරන්න, ඔබට වෛර කරන අය වෙනුවෙන් යාච්ඤා කරන්න යනුවෙනි. මෙලෙස එකී වදන්, වචනයට පමණක් සීමා නොකොට කුරුස ගසේ එල්ලී සිටිමින් ද කීවේ පියාණෙනි, ඔවුන් නොදැන කළ වරදට ඔවුන්ට සමාව දුන මැනව කියාය. එහෙයින් සැබෑ කිතුණු ප්‍රතිපත්ති අනුගමනය කරන්නෙකුට පළිගැනීම නොකළ හැක්කකි. පළි ගැනීම කිසිඳු ප්‍රශ්නයකට පිළිතුරක් ගෙන එන්නේ ද නොවේ. සැබෑ ලෙසම කිතුණු පණිවුඩය ලොවට බෙදා දිය හැක්කේ පළි ගැනීමෙන් නොව ප්‍රේමය දැක්වීමෙන් හා සමාව දීමෙන් පමණකි. පළි ගන්නා විට එකිනෙකා තුළ ගැටුම් ඇතිවීමෙන් ඇති වන්නේ විනාශය පමණකි. කිතුණු ප්‍රේමය ප්‍රකාශ කළ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

- දෙවන ජුවාම් පාවුළු ශුද්ධොත්තම පියතුමාට වෙඩි තැබූ පුද්ගලයාව උන්වහන්සේ විසින් සිප වැළඳ ගෙන සමාව දීම.
- පාස්කු දින ප්‍රහාර හමුවේ සහාව පළිගැනීමට ඉදිරිපත් නොවීම.
- සිරියාව, ඊජිප්තුව, පකිස්ථානය, ඉරානය, ඉරාකය ආදී රටවල සිදුවන කිතුණු පීඩා හමුවේ සහාව කැරලි නොගැසීම
- කෝපය, වෛරය ඇවිස්සෙන ප්‍රකාශ නොකිරීම.

7. (i) යාචක පැවිදි නිකා නම් කර, එම කාලයේ පිරිහී තිබූ සහාවේ අධ්‍යාත්මිකත්වය වර්ධනයට එම නිකායන් සිදු කළ සේවා පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

i යාචක නිකායන්

- වැල්දේසියානු
- ෆ්‍රැන්සිස්කානු

} 12 සහ 13 සියවස්වල

- දොමිනිකානු

මධ්‍යන යුගයේ සභාවේ ආධ්‍යාත්මික පිරිහීම හමුවේ සභාව තුළ නැවත ආධ්‍යාත්මික නවෝදයක් ගෙන ඒමේ අදහසින් බිහි වූ දුගීන්ගේ ව්‍යාපාර හා පැවිදි නිකා කිහිපයක් යාචන නිකා ලෙස හැඳින්වේ.

යාචක නිකායන් ලෙස ඒවා හැඳින්වූයේ ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ අවශ්‍යතාවයන් සිඟමනෙන් ලබා ගත් හෙයිනි.

11, 12, 13 යන සියවස්වලදී සභාව තුළ ආධ්‍යාත්මික ජීවිතය නංවාලීමටත් සුවිශේෂ දිළිඳුකම අනුගමනය කරමින් දේශනාවන්හි නිරත වීමටත් කණ්ඩායම් රාශියක් බිහි විය. ඒ අතර ගිහි ජනතාව විසින් ආරම්භ කළ දුගීන්ගේ ව්‍යාපාර ලෙස හැඳින්වූ ඒවා ද විය. යාචක නිකායයන් ලෙස සාමාන්‍යයෙන් සඳහන් වන්නේ වැල්දෙසියන්වරු, දොමිනිකානු සහ ෆ්‍රැන්සිස්කානු පැවදි නිකායයන් වේ. මෙයින් වැල්දේසියන්වරු සභාවට විරුද්ධව ගිය පිරිසකි. දොමිනිකානු සහ ෆ්‍රැන්සිස්කානු නිකායයන් සභාවේ නවෝදය පිණිස විවිධ අංශ වලින් උරදුන් පැවදි නිකායයන් දෙකක් ලෙස සඳහන් කළ හැකිය.

ඉතා දුගී ජීවිතයක් ගත කළ ෆ්‍රැන්සිස් තුමන් එතුමන්ගේ චාම් දිළිඳු ජීවිතය තුළින් සුවිශේෂී දිළිඳුකම සභාවට නැවත ගෙන ඒමට ක්‍රියා කළ අතර සභාවේ විනාශ වෙමින් තිබූ විශ්වාසය දේශනා කිරීම මගින් සහ නැතිවූ බැටළුවන් සොයා යාම තුළින් නැවත සභාවට හා විශ්වාසයට ඔවුන් රැගෙන ඒමට ශාන්ත දොමිනික් තුමා ක්‍රියා කළේය.

දොමිනිකානු නිකාය බිහිවීමට හේතු වූයේ ඒවකට පැවති ඇල්බිජෙන්සියානු වේද භේදයට විරුද්ධව දේශනා කිරීමටය. අධ්‍යාපනය හා දේව ධර්මය ආදීය කෙරෙහි ද සභාවට විශාල සේවාවක් දොමිනිකානු පැවදි නිකාය තුළින් සිදුවිය. මුලදී විශේෂයෙන් සාමාන්‍ය ජනතාව වෙත ගිය ෆ්‍රැන්සිස්කානුවරුද පසු කලකදී අධ්‍යාපනය හා දේශනාව කෙරෙහි ද යොමු විය.

(ii) 'සුවිශේෂක දිළිඳුකම' සැමවිටම සභාව ලෝකය තුළ ගැලවීමේ සලකුණක් වීමට උපකාරී වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

- සුවිශේසක දිළිඳුකම අනුව ජීවත් වීම සැම විටම ලෝකයාට සලකුණක් වන බව
- වත්මන් ලෝකය ක්‍රමයෙන් ලෞකිකත්වය කරා ඇදී යාම
- තාක්ෂණය විද්‍යාවට ඕනෑවට වඩා වැඩි වටිනාකමක් දීම
- මෙලොව වස්තු සම්පත්, තාන්න මාන්න ලබා ගැනීම ජීවිතය ජය ගැනීම ලෙස සිතීම
- මුදලින් සියල්ල තක්සේරු කිරීම
- සුඛෝපභෝගී ජීවිතයකට හුරු වීම
- මෙවැනි වටපිටාවක් තුළ මානව අයිතිවාසිකම්, වටිනාකම් පිරිහීම ලෞකික වශයෙන් ජය ගැනීම සඳහා කෙරෙන තරඟය
- මෙවැනි තත්වයක් තුළ චාම්, සරළ දිළිඳු ජීවිතයක් ගත කිරීම අපහසුය. එමෙන්ම
- පූජකවරු ලෝකය යන දිශානයට විරුද්ධව ගමන් කිරීම ජීවිතයේ සැබෑ වටිනාකම හා අර්ථය ගැන පණිවුඩයක් වීම
- පැවිදි ජීවිතය තුළ මෙන්ම සමාජය තුළ චාම්, දිළිඳු ජීවිතයක් ගත කිරීම අන්‍යයන්ට විශාල ආදර්ශයක් හා ජීවිතය ගැන කියා දීමට අවස්ථාවක් වීම


Past Papers Wiki - Download More Past Papers and Study Well!

8. (i) 'මානව උදාරත්වය' සම්බන්ධයෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් විස්තර කරන්න. (ලකුණු 10යි)

I

- මානව අයිතිවාසිකම් අගය කරයි.
- ශුද්ධ වූ සභාව මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශ කර ඒවා ආරක්‍ෂා කරයි.
- මනුෂ්‍යයා දේව සමානකමට හා ස්වරූපයට මැවූ බව පිළිගෙන ඔහුගේ/ඇයගේ උතුම්කම ආරක්‍ෂා කරයි.
- ජාති, ආගම්, කුළ යනාදියට අනුව මනුෂ්‍යයා බෙදා වෙන් කිරීම ප්‍රතික්ෂේප කරයි.
- මිනිස් ප්‍රජාව වඩාත් මානුෂික බවකින් පිරිපුන් කිරීමට වෙහෙසෙයි.
- කාන්තා අයිතීන් පිළිබඳව හඬ නගයි.
- ළමා මෙහෙකාර සේවය හා අයිතිවාසිකම් පිළිබඳව හඬ නගයි.
- දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ වත්මන් ලෝකය පිළිබඳ ප්‍රකාශය මඟින් පවුල් ජීවිතය, සමාජ ජීවිතය, සංස්කෘතික ජීවිතය, දේශපාලන ජීවිතය පිළිබඳ විමුක්තිදායක මත ඉදිරිපත් කර ඇත.
- ලෝක සාමය ගොඩ නැගීම පිළිබඳ සාකච්ඡා කරයි.

(ii) මානව උදාරත්වය කෙළසූ අවස්ථා **දෙකක්** සඳහන් කර, මානව උදාරත්වය ආරක්ෂා කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

ii මානව උදාරත්වය කෙලෙසූ අවස්ථා

- පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය
- සිරකරුවන් මරා දැමීම

**කෙලසන අවස්ථා**

- ළමා අපචාර
- කාන්තා හිංසනය
- ගබ්සා කිරීම
- කාන්තාවන් විවිධ ප්‍රචාරක වැඩ සඳහා යොදා ගැනීම
- ගණිකා වෘත්තිය
- නිසි වැටුප් නොගෙවීම
- ළමා මෙහෙකාර සේවය
- ලාබය සඳහා විෂ ආහාර නිෂ්පාදනය
- දෙමව්පියන් මහ මඟ දමා යාම

- මානව අයිතිවාසිකම් සුරැකීම
- මානව අයිතිවාසිකම් පිළිබඳව අධ්‍යයන ආයතන පිහිටුවීම
- අනාථ දරුවන්, පිහිටක් නැති අය රැක බලා ගැනීම
- ආබාධිත, අඳ, ගොළු, බිහිරි අය රැක බලා ගැනීම සහ සමසේ සැලකීම
- සිරකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කර ගරුත්වයෙන් සැලකීම

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI



Past Papers Wiki - Download More Past Papers and Study Well!